# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1952/11 - 2016 පෙබරවාරි මස 01 වැනි සඳුදා - 2016.02.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වන වගන්තිය යටතේ වූ නියමය

වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය ධර්මසිරි දසනායක වන මා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික) විධිවිධාන පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව පහත සඳහන් නියමයන් මෙයින් නිවේදනය කරමි.

ධර්මසිරි දසනායක,
වයඹ පළාත්, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික සංවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු,
ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2016 ජනවාරි මස 29 වැනි දින,
කුරුණෑගල දී ය.

**නියමය**

1. මෙම නියමය වයඹ පළාතේ ප්‍රාදේශීය සභාවන් හි 2016 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන බලාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නියමය වශයෙන් හැඳින්වේ.
2. වයඹ පළාතේ ප්‍රාදේශීය සභාවන් සඳහා වූ 2016 වර්ෂයට අදාළ අයවැය ලේඛනයන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සම්මත නොවුන කල් හි අදාළ ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂය සඳහා සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනයට අදාළ ප්‍රාදේශීය සභාව පිහිටි වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය යටතේ එකී ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම නිත්‍යානුකූල වන්නේ ය.
3. මෙම නියෝගය 2016.01.01 දින සිට බල පැවැත්විය යුතුවේ.

02 - 481

1A - PG 2820 — 08 (2016/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*